ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වන පනත**

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

[දිනය, 2015]

ලුහුඬු නාමය

1. මෙම පනත 2015 අංක. . . . දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1996 අංක 2 දරන පනතේ 28අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1996 වසර අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 28 වන වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම පනත තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

ඇද ගෙන යනු ලබන දැල් සහිත ධීවර මෙහෙයුම් තහනම් කිරීම.

28අ (1) තටු දෙකක් රහිතවල එහෙත් දැලෙහි නිදහස් දෙකෙලවරෙහි සිරස් අතට රිටි භාවිතා කරන දැල්ද ඇතුළුව, ඇද ගෙන යනු ලබන දැල් මඟින් කරනු ලබන ධීවර මෙහෙයුම් කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු අතර, එවැනි මෙහෙයුම් සඳහා අනුබල නොදිය යුතුය.

(2) කිසිඳු තැනැත්තෙකු ශ්‍රී ලංකා ජල තීරයේ සිදුකරන ධීවර මෙහෙයුම් සඳහා ඇද ගෙන යනු ලබන දැල් භාවිත කිරීම, සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, මිලදී ගැනීම හෝ අලෙවි කිරීම නොකළ යුතුය.

(3) ශ්‍රී ලංකාවේ ජල තීරයේ ඇද ගෙන යනු ලබන දැල් යොදා සිදු කරන ධීවර මෙහෙයුම් සඳහා ප්‍රධාන ප්‍රඥප්තියෙහි II කොටස යටතේ කිසිඳු තැනැත්තෙකුට බලපත්‍ර නිකුත් නොකළ යුතුය.

(4) ශ්‍රී ලංකාවේ ජල තීරයේ ඇද ගෙන යනු ලබන දැල් යොදා සිදු කරන ධීවර මෙහෙයුම් සඳහා දැනට නිකුත් කර ඇති සියලුම බලපත්‍ර නැවත අලුත් නොකළ යුතු අතර බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉදිරිපත් වන්නාවූ අයදුම්පත් භාර නොගත යුතුය.

එසේ වුවද, ඇද ගෙන යනු ලබන දැල් භාවිතයට දැනටමත් නිකුත් කර ඇති හා මෙම පනත බලාත්මක වන දිනට පෙර දින වලංගුව පැවති බලපත්‍රයක් -මෙම පනතෙහි කුමක් සඳහන්ව ඇතත් - බලපත්‍රය නිකුත් කරන ලද අරමුණට අනුකූලව, බලපත්‍රයෙහි නිර්දේශිත කාල සීමාව සඳහා අඛණ්ඩව වලංගු වෙයි.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 49(6) වැනි වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම ප්‍රධාන ප්‍රඥප්තිය තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 49(7) වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

වැරදි. **49** (7) මෙම පනතේ 28අ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ හා අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් සිදුකරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිටදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් පනස් දහකට නොඅඩු දඩ මුදලක් ගෙවීම සඳහා යටත් විය යුතු ය.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 66 වන වගන්තියෙහි ඇතුලත් "ශ්‍රී ලංකා ජල තිරය" යන නිර්වචනයට පසු පහත සඳහන් නිර්වචනයන් ඇතුලත් කිරීමෙන් එම ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 66 වන වගතිය සංශෝධනය කිරීම.

"ඇද ගෙන යනු ලබන දැල" යනුවෙන් හඳුන්වනු ලබන්නේ කේතවක හැඩය ගත දැල් කඳක සිහින් කෙලවරට මඩියක් සම්බන්ද කර ඇති, අනෙක් කෙළවරෙහි දෙපසට තටු දෙකක් සම්බන්ද කර ඇති හෝ නැති දැල් විශේෂයකි.

"ඇද ගෙන යනු ලබන දැල් යොදා සිදුකරන ධිවර මෙහෙයුම්" යනු ජල පත්ලෙන් හෝ ජලය තුළින් යාන්ත්‍රිකව දැලක් ඇද ගෙන යාම මගින් සිදු කරනු ලබන ධිවර මෙහෙයුමකි.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.